# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2017.02. 23 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 07-2016 (i)

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ව්‍යවස්ථාපිත අධිකාරී/ආයතන ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සඳහා වෙන්කිරීම**

**Provision of Communication facilities for the officers in Commercial Corporations, Statutory Boards and State Owned Companies.**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 2/2015 හා 2015.05.25 දිනැති ලිපිය හා බැඳේ.

02.ඒ අනුව ව්‍යවස්ථාපිත අධිකාරී/ ආයතන වල සුදුසුකම් ලත් නිලධාරීන්ට සියළුම සන්නිවේදන බිල්පත් (රාජකාරී සහ නිවාස දුරකථන, ෆැක්ස්, පුද්ගලික ජංගම දුරකථන සහ අන්තර්ජාල සම්බන්ධතා) සඳහා මාසිකව ගෙවිය හැකි සංශෝධිත උපරිම සීමාවන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | නිලධාරී කාණ්ඩය | මාසික උපරිම වියදම් සීමාව (සියලුම බදු හා මාසික ගාස්තු ඇතුළත්ව) රුපියල් |
|---|---|---|
| 1 | සභාපති/නියමිත බලධාරීන් ( Chairman/ Competent Authority) | 10000.00 |
| 2 | ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකරණ අධ්‍යක්ෂ/විධායක නිලධාරී/ක්‍රියාකාරී අධ්‍යක්ෂ(Chief Executive Officer/Managing Director/Executive Director/Working Director) | 9000.00 |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන මෙහෙයුම් නිලධාරී/අභ්‍යන්තර විගණක සහ අනෙකුත් සම තත්ත්වයේ නිලධාරීන්(Chief Finance Officer/Chief Operations Officer/Internal Auditor and any other Officers in similar status) | 7000.00 |
| 4 | අධිකාරිය/ආයතනය මගින් අනුමත අනෙකුත් විධායක නිලධාරීන්(Other staff Officers approved by the Board) | 5000.00 |

03.මෙම විෂය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016.12.21 දිනැති ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 07 – 2016 මෙයින් අවලංගු කරනු ලබන අතර මෙම 07-2016 (i) නව උපදෙස් ලිපිය මඟින් සංශෝධිත විධිවිධාන 2017.02.01 දින සිට අදාළ කර ගත යුතුය.

04.ඒ අනුව ඔබ ව්‍යවස්ථාපිත අධිකාරිය/ආයතනය විසින් නිලධාරීන් සඳහා සන්නිවේදන බිලපත් ගෙවීමේදී මෙම ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි(මුදල්) 07-2016 (i) හි සඳහන් සංශෝධිත උපරිම සීමාවන් සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 2/2015 හි සඳහන් අනෙකුත් උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.